# ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ ප්‍රකාශය

සාර්ක් අමාත්‍ය මණ්ඩල සභාවේ තිස්හත් වන සැසිය -
2016 මාර්තු 17 වන දින, පොඛාරා, නේපාලය

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි,
සාර්ක් මහලේකම් තුමනි, සම්භාවනීය නියෝජිතයිනි,
නෝනාවරුනි, මහත්වරුනි,

ප්‍රසන්න වූත්, සුන්දර වූත් පොඛාරා නගරයේ පැවැත්වෙන සාර්ක් අමාත්‍ය මණ්ඩල සභාවේ මෙම වැදගත් සැසියට සහභාගි වීමට ලැබීම ඇත්ත වශයෙන්ම මා හට මහත් සතුටට කරුණකි.

මා වෙත හා මගේ නියෝජිත කණ්ඩායම වෙත ලබාදුන් උණුසුම් ආගන්තුක සත්කාරයටත්, මෙම රැස්වීම පැවැත්වීම වෙනුවෙන් විශිෂ්ඨ ලෙස කටයුතු සංවිධානය කර තිබීම සම්බන්ධයෙනුත් මාගේ අවංක ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි. වර්තමාන සාර්ක් සභාපතිත්වය දරන රට ලෙස නේපාලය විසින් ඉටුකරන ක්‍රියාශීලී හා දැක්මක් සහිත නායකත්ව භූමිකාව ශ්‍රී ලංකාවේ ඇගයීමට ලක්වන අතර, එමගින් සාර්ක් ක්‍රියාවලියේ ප්‍රගමනයට වැඩිමනත් වූ ජවයක් එක්කොට තිබේ.

නේපාලයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍ය හා විදේශ කටයුතු අමාත්‍ය අතිගරු කමල් තාපා මැතිතුමාගේ සභාපතිත්වය යටතේ අද දින අප විසින් සිදුකරන සාකච්ජා, සාර්ක් ක්‍රියාවලිය හා සාර්ක් සංවිධානය විසින් ගෙන ඇති පියවරවල් කෙරෙහි මහත් ඵලදායක වනු ඇතැයි මම විශ්වාස කරමි. මෙම රැස්වීමේ පෙර සූදානම් කටයුතු සඳහා ලබාදුන් වැදගත් දායකත්වය වෙනුවෙන් මහලේකම් අර්ජුන් බහදූර් තාපා මැතිතුමාටත්, සාර්ක් මහලේකම් කාර්යාලයටත් ස්තූතිවන්ත වෙමි.

ගරු සභාපතිතුමනි,

සාර්ක් සංවිධානය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුවන බැඳීම්වලට අනුකූල වෙමින් සහ විවිධ ක්ෂේත්‍රවලට අදාළව සාර්ක් සංවිධානය විසින් ආරම්භ කර පවත්වා ගෙන යන ක්‍රියාකාරකම් ඉදිරියට ගෙනයාමේ අරමුණින්, ශ්‍රී ලංකාව සාර්ක් සංවිධානය සමඟ පවත්වාගෙන යන සබඳතා කෙරෙහි ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී කටයුතු කරයි. පසුගිය වසරේදී පමණක්, වැදගත් සහයෝගීතා ක්ෂේත්‍රවලට අදාළව පවත්වනු ලැබූ සාර්ක් රැස්වීම් සහ වැඩමුළු එකොළහකට ශ්‍රී ලංකාව සත්කාරකත්වය ලබාදී තිබේ. තවද, ශ්‍රී ලංකාවෙන් පිටත පැවැත්වුණු විවිධ සාර්ක් රැස්වීම් සඳහා විශේෂඥයන් හා වෘත්තිකයන් සහභාගි කරවීම පිණිස රජය විසින් ජාතික වශයෙන් වැදගත් වන නියෝජිතායතනවලට අවශ්‍ය සම්පත් සපයනු ලැබීය. මේ යටතේ සාර්ක් රැස්වීම්වලට සහභාගි වූ විශේෂඥයන් හා වෘත්තිකයන් සංඛ්‍යාව සියය (100) ඉක්මවයි.

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම අනුව කෙරෙන වෙළඳාම් ප්‍රමාණය වැඩිවෙමින් පවතින නමුත් සාර්ක් කළාපය තුළ සිදුවන අන්තර් කලාපීය වෙළඳාම, එහි ශක්‍යතා මට්ටමට වඩා බෙහෙවින් පහළ අගයක් ගනී. දකුණු ආසියානු රටවල් අතර කලාපීය සහයෝගීතාව හා සමෝධානය එම රටවල් අතර තරඟකාරිත්වය හා එම රටවල ඵලදායිතාව වැඩි දියුණු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

විවෘත වෙළඳාම, ස්ථායිතාව හා මිත්‍රශීලී ආයෝජන ප්‍රතිපත්ති තුළින් කලාපයට විදේශීය සෘජු ආයෝජන ගලා ඒම කෙරෙහි පෙළඹවීමක් කළ හැකිය.

කළාපීය හා බහුපාර්ශවීය ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කරගැනීමෙහිලා සාර්ක් රටවල් සමඟ එක්ව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව ඇපකැප වී සිටී. ශ්‍රී ලංකාව සාර්ක් සාමාජික රාජ්‍ය ගණනාවක ඒකාබද්ධ යෝජනාවලට එකඟවන අතරම සෙසු පාර්ශව අප්‍රසාදයට ලක්වීමට තුඩුදෙන කටයුතු තව දුරටත්, ශීඝ්‍ර ලෙස බැහැර කරමින් සිටින්නීය.

සාර්ක් අමාත්‍යවරුනි,

දිළිඳුකම තුරන්කිරීම හා කලාපීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සාර්ක් සංවිධානය විසින් නිරන්තර ප්‍රමුඛත්වයෙන් යුතුව සලකන ලද කටයුතුය. එතෙකුදුවුවත් ලෝකයේ දිළිඳු ජනතාවගෙන් 44%ක් නිජබිම කරගෙන සිටින්නේ සාර්ක් කලාපයයි. අලුතෙන් පිළිගන්නා ලද තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව අවස්ථානුකූලව කටයුතු කිරීමත් කළාපය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කලාපීය යාන්ත්‍රණයක් සකස් කිරීමත් සාර්ක් කළාපය තුළ අවශ්‍යයෙන්ම කළයුතු දේවල්ය.

සභාපතිතුමනි,

වර්තමානයේ ආරක්ෂාව පිළිබඳව සම්ප්‍රදායිකවූ හා සම්ප්‍රදායික නොවන අභියෝග සංකීර්ණ වී එකට වෙළී පවතී. ත්‍රස්තවාදයෙන් හා මුහුදු කොල්ලකෑම්වල නීති විරෝධී මිනිස් ජාවාරම් කටයුතු වල හා නීති විරෝධී ලෙස ආනයන අපනයන කටයුතුවල නිරත නීති විරෝධී රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ විවිධ සංකීර්ණ හා සියුම් කටයුතු මැඩ පැවැත්වීම සඳහා සහයෝගයෙන් හා සමායෝජනයෙන් යුතුව කඩිනමින් කටයුතු කළ යුතුව ඇත.

අමාත්‍යවරුනි,

දකුණු ආසියානු රටවල් වශයෙන් අප සතු සාරවත් සංස්කෘතිය හා උරුමය පිළිබඳව අපි ආඩම්බර විය යුත්තෙමු. අප පවත්වාගෙන යන සංස්කෘතික සබඳතා පිළිබඳව විවිධ රටවල ජනතාවගේ මට්ටමින් දැනුවත්භාවයක් ඇතිකළ යුතුය. සංස්කෘතික හුවමාරු ,අපගේ සාහිත්‍ය, මෙන්ම අපගේ උරුමයෙන් ලද දැනුම සහ කුසලතා, කලාපයේ හා ඉන් ඔබ්බට පුළුල් ප්‍රජාවක් අතරේ ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ පිහිටි සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානයේ කටයුතු පුළුල් කිරීමට ශ්‍රී ලංකාව පියවර ගනිමින් සිටියි.

වර්ෂයක් පාසා පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් ජාත්‍යන්තර සාහිත්‍ය උළෙලක් වන “ගාලු සාහිත්‍ය උළෙල“ මීළඟට සාර්ක් සංගමයේ අනුග්‍රහය යටතේ ඓතිහාසික ගාලු පුරවරයේදී පැවැත්වීමට අපි යෝජනා කරමු.

සභාපතිතුමනි, අද අභියෝග ලෙස පවතින කාලගුණික විපර්යාස හා ස්වාභාවික ආපදාවලට මුහුණදීම සඳහාද කලාපීය හා ගෝලීය වශයෙන් සාමුහිකව කටයුතු කළ යුතුය. මෙම කළාපය තුළ ඇතිවන ස්වභාවික ආපදාවල දරුණුකම හා ඒවා නැවත නැවත ඇතිවීම අප ජනතාවට බරපතල අභියෝගයක්ව පවතියි.

2015 අප්‍රියෙල් 25 වැනි දින, නේපාලයේ ඇතිවූ දරුණු භූමිකම්පාවෙන් පසුව එහි ජනතාව පෙන්නුම්කළ දිරිමත්භාවය, ශක්තිය හා නැවත යථා තත්ත්වයට පත්වීමේ හැකියාව පිළිබඳව එම ජනතාවට මාගේ අචාරය පුද කරමි. ජනාධිපතිතුමා හා අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස්වලට අනුව, නේපාල සහෝදර ජනතාවට හදිසි උපකාර ලබාදීමට අනෙක් රටවල් සමඟ එක්වීමට ශ්‍රී ලංකාවට අවස්ථාව උදාවූ බව ප්‍රකාශ කරන්නේ සතුටිනි. මෙම භූමිකම්පාවෙන් විනාශයට පත් හින්දු හා බෞද්ධ ආගමික ස්ථාන දෙකක නැවත ඉදිකිරීමේ කටයුතුද ශ්‍රී ලංකාව භාරගෙන තිබේ.

නේපාලයට පමණක් නොව කලාපයේ අනෙකුත් රටවලටද භූ කම්පනය බලවත් අභියෝගයක් එල්ල කළ අතර එය, අනාගතයේදී එවන් අභියෝගයකට මුහුණදීම සම්බන්ධයෙන් එම රටවල් සතු සූදානම පිළිබද ප්‍රශ්න කරන්නක් විය.

නේපාලය මුහුණ දුන් අවාසනාවන්ත තත්ත්වයට නිසි ආකාර ප්‍රතිචාර දැක්වීමට කලාපීය සංවිධානයක් වශයෙන්, සාර්ක් සංවිධානයට නොහැකි වීම තුළින් කළාපය පොදුවේ මුහුණදෙන තර්ජන අවම කර ගැනීම සඳහා ප්‍රතිචාර දැක්වීමේ ඒකාබද්ධ යාන්ත්‍රණයක අඩුපාඩුව මොනවට පැහැදිලි කරයි.

අපගේ අවධානය යොමුවිය යුතු වැදගත් අංගයක් නම් කලාපීය මධ්‍යස්ථානයි. සියලුදෙනාම දැනුවත් වී ඇති පරිදි කලාපීය මධ්‍යස්ථාන සංඛ්‍යාව සමස්තයක් වශයෙන් අවම කිරීමට සාමාජික රටවල් අතර පැවති එකඟතාවය සඳහා ශ්‍රී ලංකාව සහයෝගය ලබාදුන්නේ එම ඒකාබද්ධ කිරීම් සහ මධ්‍යස්ථාන වසා දැමීම් තුළින් වඩා ප්‍රමුඛත්වයක්

ලබාදිය යුතු ක්ෂේත්‍ර කෙරෙහි සිය අවධානය යොමු කිරීමට සාර්ක් සංවිධානයට හැකිවනු ඇතැයි යන බලාපොරොත්තුව මතය. අප කලාපයේ ජීවත්වන මිලියන ගණනක් වන ජනතාවගේ යහපත උදෙසා ආපදා අවදානම අවම කිරීම, සූදානම, දේශගුණික විපර්යාස සඳහා ඇති අනුකූලතාව සහ කලාපයේ අනෙකුත් ප්‍රමුඛතාවන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වෙනුවෙන් අප ඉදිරිපත් විය යුතු අතර, ඒ සඳහා නව කලාපීය මධ්‍යස්ථානය වන සාර්ක් පරිසර හා ආපදා කළමණාකරන මධ්‍යස්ථානය (SEDMC) ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාව, දකුණු ආසියාව තුළ ශක්තිමත් බහුවිධ සහයෝගීතාවක් ගොඩනගා ගැනීම පිළිබඳ බලාපොරොත්තු දල්වා සිටින බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. තවද, සාර්ක් ප්‍රඥප්තියේ දැක්ම යථාර්තයක් බවට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාව නොපිරිහෙලා තම වගකීම ඉටුකරන බවට මෙම ගරු අමාත්‍යවරුන් ඉදිරියේ මම සහතික වෙමි.

ස්තූතියි.